රාජ්‍ය මුද්‍රණ සංස්ථාව - 2020

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ එවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
--------------------------------------------------------------------------------

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ අගය (Residual value) සහ එහි ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කල යුතු අතර , අපේක්ෂා කල අගයන් පෙර ඇස්තමේන්තු අගයන් ගෙන් වෙනස් වේ නම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්කමක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 | 2016 සිට 2019 දක්වා අඛණ්ඩව අලාභ තත්වයක් නිසාද ඒ සඳහා සැලකිය යුතු වියදමක් සහ කාලයක් ගතවන නිසාද කොවිඩ් වසංගත තත්වය යටතේ කාර්යයන් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවූ නිසාද 2020 වර්ෂය සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැත. කෙසේ වුවද 2021 වර්ෂය සඳහා එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා කටයුතු කරනු ඇත. | අදාල ගිණුම් ප්‍රමිතිය අනුව ගිණුම් තැබීම සිදු කල යුතුය. |

ප්‍රකාරව ගිණුම්ගත කලයුතු වුවද , මුළුමනින්ම ක්ෂය කර ඇති එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු.4,186,450ක් වටිනා පරිගණක උපාංග ඒකක 270ක ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර නොතිබුණි.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2021 ජනවාරි වන 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා , එම වර්ෂයේ ලාභය මත ගෙවීමට අනුමත කරන ලද එකතුව රු.48,528,036ක් වූ ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන සිදුකර නොතිබූ බැවින් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කොට ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 9(ඇ) ඡේදය ප්‍රකාරව ගිණුම් තැබීම සිදුකල යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය සඳහා අදාල රු.12,703,425 ක් වූ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සිදුකර නොතිබූ බැවින් ලාභය ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රසාද දීමනා / දිරිදීමනා ගෙවීම සඳහා මේ දක්වා සංස්ථාව තුල නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ අතර 2021.01.21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පැමිණීම සහ කාර්යසාධනය පදනම් කරගෙන ප්‍රසාද දීමනා / දිරිදීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර , එම දීමනා පෙර වර්ෂයේ ලාභය පදනම් කරගෙන එළඹෙන ඊළඟ වර්ෂයේ ගෙවීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව එය 2021 ගිණුම් වර්ෂයේ වාර්තා මගින් පෙන්වා දුන් පරිදි 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (LKAS 19) ට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව පාරිතෝෂිකය Actuarial value ක්‍රමය පදනම් කරගෙන බාහිර විගණක ආයතනයක් මගින් පිළියෙල | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව ගිණුම් තැබීම සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| | කරනලද එම ලේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 02) LKAS 19 ට අනුව (Net defined benefit liability ) ශුද්ධ අගය ගණනය කර ඇති අතර මෙය 2020 මූල්‍ය ප්‍රකාශණයෙහි.(5.1) ඡේදයේ හෙලිදරව් කර ඇත. මේ දක්වා වෙන් කර ඇති සංචිත ප්‍රමාණය ප්‍රමාණවත් බැවින් 2020 වර්ෂය සඳහා ලාභයෙන් වෙන් කිරීමක් සිදුකර නොමැත. | |
| (iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්‍රණ කටයුතු අවසන් නොකර නොනිමි තත්වයේ තිබූ එකතු වටිනාකම රු.24,356,981 ක් වූ ඇණවුම් 16ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායමක් ලෙස සැලකීම නිසා විකුණුම් හා ණයගැති අගයන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම පරිදි මුද්‍රණ කටයුතු අවසන් නොවුවද ඔවුන් සඳහා ඉන්වොයිසියන් නිකුත් කිරීම සිදු කරනු ලබයි. එහෙත් එසේ නිකුත් කල මුද්‍රණ කටයුතු අවසන් අදියරේ පැවති බැවින් නොනිම් වැඩ (work in progress) වලින්ද එම පිරිවැය ඉවත් කිරීමට කටයුතු කර ඇත. එමගින් ද්විගණනයක් වීම වැලැක් වූ අතර එය සත්‍ය වශයෙන්ම 2020 අදාලව උත්පාදනය වූ ආදායමක් බැවින් සමාලොචිත වර්ෂයේ ගිණුම් සඳහා ගලපා ඇත. | අදාල නිවැරදි කිරීම් සිදුකල යුතුය. |
| (iv) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන භාවිතා කරන ලද රු.685,422 ක් වටිනා ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතිය ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.17,840කින් අඩුවෙන් දක්වා තිබුණි. | ERP පද්ධතිය සමාලෝචිත ගිණුම් වර්ෂයේදී ආරම්භක අදියරේ පැවති අතර ERP පද්ධතිය සඳහා ඒ වන විට කිසිදු දත්තයක් ඇතුළත් කර නොතිබුණි. එය භාවිත මට්ටමට පැමිණි පසු පිරිවැය ගණනය කොට ක්ෂය කිරීම සිදු කිරීමට කටයුතු කරනු ලබයි. | නිවැරදිව ක්ෂය ගිණුම්ගත කළයුතුය. |

1.5.4 නොසැසඳූ පාලන ගිණුම්
-------------------------------

| | | |
|---|---|---|
| මුද්‍රණ සංස්ථාවේ ලෙජරයේ කේවල ගිණුමේ ශේෂ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 14 කින් අයවිය යුතු ශේෂය රු.5,010,272 ක් වුවද එම | මේ පිළිබඳව අදාල ආයතනයන් විසින් ඉදිරිපත් කල ශේෂ සමග ලබාදුනහොත් වැඩිදුර සොයා බලා තොරතුරු ඉදිරිපත් කල හැකි අතර වෙනත් ආයතනයක් විසින් ලබාදෙන | අයවියයුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

ආයතනය විසින් විගණනයට තොරතුරු වල නිවැරදිභාවය තහවුරු කරන ලද ශේෂය පිළිබඳව ද ගැටළු ඇත. රු.2,725,010ක් විය.

1.6 නීතිරීති රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීතිරීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(ii) ඡේදය | පිරිවිතර ස්වභාවයෙන් උත්පාදනය වන බවත් , සමාන මට්ටමකින් තරඟකාරී බව ප්‍රවර්ධනය කළ හැකි බවටත් සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම සිදුකළ යුතු වුවද පිරිවැය රු.113,600,114 ක් වූ “ලොම්බාර්ඩ් 30 “ වර්ගයේ යන්ත්‍රය මිලදී ගැනීමේදී එලෙස පිරිවිතර විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි. | ලොතරැයි මණ්ඩලය විසින් scratch ලොතරැයිය සංස්ථාව වෙත ලබාදී නොමැති නිසාත් , එම අවස්ථාවේදී මිල වැඩි නිසාත් තාක්ෂණික කමිටුව එය බැහැර කර ඇත. ඉහත ලංසුව සඳහා එක් ලංසුවක් පමණක් ලැබී තිබූ අතර , ලංසු ලේඛනය section & schedule of requirement කොටසෙහි ලංසුකරුවන්ගේ පිළිතුරෙහි “ඔව් “ හා “නැත “ ලෙසට පැහැදිලිව දක්වා ඇති හෙයින් විකල්ප වශයෙන් තරඟකාරී වෙනත් ලංසුකරුවන් සමග සංසන්දනාත්මක විශ්ලේෂණයක් මෙහිදී අවශ්‍ය වී නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ii)2020 දෙසැම්බර් 18 දිනැති අංක PED 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | ප්‍රසාද දීමනා ගෙවිය යුත්තේ 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන වුවද , 2020 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සේවකයින් 565 කට අවස්ථා දෙකකදී ප්‍රසාද දීමනා ලෙස රු.48,528,036ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. | ප්‍රසාද දීමනා / දිරි දීමනා ගෙවීමට සංස්ථාව තුල නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ අතර 2021 ජනවාරි 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය පරිදි ප්‍රසාද දීමනා ගෙවා ඇත. | අදාල චක්‍රලේඛය පදනම් කරගෙන ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.22,914,300 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 169,428,397 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.192,342,697 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් මුද්‍රණ ආදායම වැඩිවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ලොතරැයි ප්‍රමාද වී මුද්‍රණය කර භාරදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය ගෙවන ලද මුදලින් එකතුව රු.11,205,760 ක් ප්‍රමාද ගාස්තු ලෙස අඩුකර ගෙන තිබුණු අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලොතරැයි ආදායම වූ රු.266,593,026 හා සැසඳීමේ සියයට 04ක ප්‍රතිශතයක් විය. | 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගතය නිසා සැලකිය යුතු කාලයක් ආයතනය වසා දැමීමට හේතු වූ අතර පැවති ගැටළු සහිත තත්වයක් යටතේ ලොතරැයි මුද්‍රණය කර ලොතරැයි මණ්ඩලයට ලබාදීම ප්‍රමාද වීමෙන් මෙසේ දඩ මුදල් අයකර දී ඇත. | ප්‍රමාද ගාස්තු නොගෙවීම සඳහා අප්‍රමාදව මුද්‍රණය කර භාරදීමට වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |
| (ii) 2021 පාසැල් අධ්‍යයන වර්ෂය සඳහා අවශ්‍ය පාසල් පෙළ පොත් දින 01 සිට දින 49 ත් අතර කාලයක් තුල ප්‍රමාද වී මුද්‍රණය කර භාරදීම නිසා සමාලෝචිත වර්ෂයේ පෙළපොත් මුද්‍රණයට ආදායමින් එකතුව රු.14,918,809 ක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාද ගාස්තු ලෙස අඩුකර ගෙන තිබුණි. | පොත් වර්ග 17 ක් සඳහා රු.9,879,137 ක් ප්‍රමාද ගාස්තුවක් ලෙස අයකර ඇති අතර පිටු අඩු වීම නිසා රු.5,039,672 ක් දඩ ලෙස අඩු කරගෙන ඇත. | පාසල් පෙළ පොත් කඩිනමින් මුද්‍රණය කර භාරදීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

## 3.2 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 7න් 5ක්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු වී තිබූ තනතුරු වලින් තනතුරු 3ක් දින 12 සිට මාස 26ක කාලපරිච්ඡේදයක් තුල පුරප්පාඩුව පැවතුණි. එසේම මුද්‍රණ කටයුතු සඳහා සෘජුවම බලපානු මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් 04 ක් කණිෂ්ඨ මට්ටමේ කළමණාකරුවන් 11ක් සහකාර නිලධාරීන් 14ක් හා කළමණාකරණ සහකාර (තාක්ෂණික) නිලධාරීන් 86 ක් වශයෙන් නිලධාරීන් 115 කගේ තනතුරු පුරප්පාඩු වී තිබුණි. එම පුරප්පාඩු වූ තනතුරු ප්‍රමාණය එම තනතුරු බාණ්ඩයේ අනුමත සේවක සංඛ්‍යාවෙන්සියයට 44 ක් විය. එසේම ප්‍රාථමික මට්ටමේ නුපුහුණු ගණයේ කාර්යමණ්ඩලයේ 82ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරික්තව පැවතුණි. | සාමාන්‍යාධිකාරී තනතුර - 2021/03/29 දින සිට සැපයුම් කළමණාකරු වැඩ බැලීමේ පදනමටත් මුදල් කළමණාකරු - 2020/07/27 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වැඩ බැලීමේ පදනමට ත් මානව සම්පත් කළමණාකරු - අධ්‍යාපන අමාත්‍යාංශයේ දහම් පාසල් පිරිවෙන් අධ්‍යක්ෂ 2021/05/06 දින සිට වැඩ බැලීමේ පදනමටත් පත් කර ඇත.<br>අලෙවි කළමණාකරු සංවරණ සීමා ඉවත් කල පසු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර - දැනට පුරප්පාඩුව පවතින අතර ඉදිරි කාලය තුල බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. කණිෂ්ඨ මට්ටමේ තනතුරු වල පරිපාලන නිලධාරී හා අලෙවි පර්යේෂණ නිලධාරී තනතුරු ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරන අතර ආශ්‍රිත නිලධාරී පුරප්පාඩු 14 බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>කළමණාකරණ සහකාර (තාක්ෂණික) මට්ටමේ තනතුරු 05ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත. | අදාල තනතුරු කඩිනමින් පිරවිය යුතුය. |